# වෛරී කථනය වැළක්වීම සඳහා භාවිතා කළ හැකි මෙවලම්

ශ්‍රී ලංකා ජාතික සාම මණ්ඩලය

# අරමුණ...

ශ්‍රී ලංකීක සමාජය තුල වෛරී කථන භාවිතාව දිනෙන් දින ඉහළ යමින් පවතියි. හුදු වචන භාවිතයෙන් ඔබ්බට ගිය වෛරී කථනයන් නිසා පුද්ගලයන් හා පුද්ගල කණ්ඩායම් අතර මෙන්ම සමස්ත සමාජය තුළද හිංසනය, වෛරය සහ ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් ව්‍යාප්ත වෙමින් පවතියි. පසුගිය දශකය පිළිබඳව අධ්‍යයනය කිරීමේදි සමාජ මාධ්‍ය භාවිතාව වේගයෙන් ඉහල ගොස් ඇති අතර එවා හා සමගාමීව වෛරී ප්‍රකාශනයන්ද වර්ධනය වී ඇති බව පැහැදිලිව දැක ගත හැකිය. වෛරී කථනය හා සම්බන්ධ ප්‍රකාශන වැළක්වීම සඳහා ශ්‍රී ලාංකීක නීති පද්ධතිය තුළ නීතිමය ප්‍රතිපාදන වෙන් වී ඇති අතර අවස්ථා කිහිපයකදීම ඊට සංශෝධනයන්ද ඒක් වී ඇත.

ජාතික සාම මණ්ඩලය ශ්‍රී ලංකාවේ ජන වර්ගයන් අතර සාමය සහ සංහිඳියාව ගොඩ නැංවීම වෙනුවෙන් නිරන්තර පෙනී සිටියි. වෛරී ප්‍රකාශන භාවිතාව නිසා, සමාජය හිංසනය සහ ප්‍රචණ්ඩකාරීත්වය කරා යොමු වෙන පසුබිමක වෛරී ප්‍රකාශන වැළක්වීම වෙනුවෙන් ජනතාව දැනුවත් කිරීමේ අරමුණින් මෙම මෙවලම් එකතුව සම්පාදනය කර ඇත. මේ තුළ වෛරී ප්‍රකාශන හඳුනා ගැනීම්, ඒයට පාදක වන හේතුන්, වෛරී ප්‍රකාශන සිදු කළ හැකි මාධ්‍ය, වෛරී ප්‍රකාශන වැළක්වීම සඳහා ඇති ජාතික සහ ජාත්‍යන්තර නීතිමය ප්‍රතිපාදන මෙන්ම ඒය වැළක්වීම සඳහා ගත යුතු ක්‍රියාකාරකම් පිළිබඳව සාකච්ඡා කර ඇත.

මෙම මෙවලම් එකතුව මනාව අධ්‍යනය කිරීමෙන් වෛරී ප්‍රකාශන භාවිතාව සහ ඒය වැළක්වීමේ අවශ්‍යතාව පිළිබඳව පුළුල් දැනුමක් ඔබට ලබා ගත හැකිය. එමෙන්ම වෛරී ප්‍රකාශන වලින් වැලකීමට ඔබට දායක වීම මෙන්ම වෛරී ප්‍රකාශන වැළක්වීමෙන් සමාජය සුවපත් කිරීමේ ක්‍රියාවලියට ඔබේ දායකත්වය ලබා ගැනීම මෙම මෙවලම් එකතුවේ අරමුණ වන්නේය.

# පටුන


## 1. වෛරී ප්‍රකාශනයන් යනු කුමක්ද ?

**1.1 වෛරී ප්‍රකාශනයන් පිළිබඳ නිර්වචන**

**1.2 වෛරී ප්‍රකාශන වල අයහපත් බලපෑම**

1.2.1 නිදහස් සමාජයේ අඩිතාලම වලට හානි පමුණුවයි

1.2.2 මිනිසාගේ ගෞරවයට හානි පමුණුවයි

1.2.3 සමාජ ස්ථාවර සඳහා සෘණාත්මක ලෙස බලපායි

1.2.4 ඉලක්කගත පුද්ගලයාට සහ කණ්ඩායම් වලට මානසික හානියක් ඇති කිරීම

1.2.5 ප්‍රචණ්ඩත්වය හා ගැටුම් දක්වා වර්ධනය වීමේ හැකියාව

1.2.6 වෛරී ප්‍රකාශන වලට අපරාධයක් දක්වා විකාශනය වීමේ හැකියාව පවතියි

**1.3 වෛරී කථනයේ සන්නිවේදකයන් කවුද?**

## 2. වෛරී ප්‍රකාශ ඇති වන්නේ ඇයි ?

**2.1 වෙනස් කොට සැලකීම**

**2.2 ප්‍රචණ්ඩකාරී ක්‍රියාකාරීත්වය සාධාරණීකරණය කිරීමට අවශ්‍ය පසුබිම ගොඩනගා ගැනීම**

**2.3 යම් ජන කොට්ඨාශයකට එරෙහිව වැරදි මතයක් සමාජගත කිරීම**

# 3. වෛරී ප්‍රකාශන හඳුනාගැනීම

3.1 වෛරී ප්‍රකාශන හඳුනාගන්නා ආකාරය

3.2 සමාජ මාධ්‍ය තුළ වෛරී ප්‍රකාශන හඳුනා ගැනීම

# 4. වෛරී ප්‍රකාශ කළ හැකි මාධ්‍යයන්

# 5. සමාජ මාධ්‍යය හා වෛරී ප්‍රකාශන

5.1 වෛරී ප්‍රකාශ සමාජගත වීම කෙරෙහි බලපාන කරුණු

# 6. සමාජ මාධ්‍යය තුළ වෛරී ප්‍රකාශන දුටු විට ඔබ කළ යුත්තේ කුමක්ද?

# 7. වෛරී කථනය පිළිබඳ නීතිමය ප්‍රතිපාදන

7.1 අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය හා වෛරී ප්‍රකාශන

7.2 වෛරී කථනය පිටු දකින ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රතිපාදන

7.3 එක්සත් ජාතීන්ගේ සිවිල් හා දේශපාන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICCPR)

7.4 සෑම ආකාරයකටම වාර්ගික වෙනස් ලෙස සැලකීම තුරන් කිරීම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (CERD)

## 8. වෛරී කථනය තහනම් කරන ශ්‍රී ලාංකික නීති

8.1 2007 අංක 57 දරණ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්මුතිය පනත

8.2 දණ්ඩ නීති සංග්‍රහය - 19වන අධිකාරිය

8.3 පොලිස් ආඥා පනත - 13වන අධිකාරිය

8.4 1958 අංක 41 දරණ ආගමික අපහාසකාරී ප්‍රකාශන පනත

8.5 1979 අංක 48 දරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත

## 9. වෛරී කථනය තහනම් කරන ශ්‍රී ලාංකික නීති

9.1 වෛරී කථනයට අදාළ නීති සංශෝධනයන් පිළිබඳ උත්සාහයන්

## 10. වෛරී කථනය වැළැක්වීම පිණිස කල යුතු දේ

10.1 වෛරී කථනය වැළැක්වීම පිණිස කලය යුතු දේ

10.2 වෛරී කථනය වෙනුවට ප්‍රතිකථනය



# 1. වෛරී ප්‍රකාශනයන් යනු කුමක්ද ?

## වෛරී ප්‍රකාශනයන් යනු කුමක්ද ?




සංකේත

වෛරී කථනය යනු හුදෙක් රළු වචන වලට වඩා වැඩි යමකි.
එය කිසියම් පුද්ගලයෙකුට හෝ පුද්ගල කණ්ඩායමකට එරෙහිව වෛරී අවමානයට ලක් කිරීම හෝ උසි ගැන්වීම අරමුණු කරගත් ඕනෑම ආකාරයක ප්‍රකාශනයක් විය හැකිය.
එමෙන්ම වචන, සංකේත, රූප, ඉමෝජි, සහ විඩියෝ භාවිතා කරමින් එය සන්නිවේදනය කිරීමේ හැකියාවද පවතී.



# 1.1 වෛරී ප්‍රකාශනයන් පිළිබඳ නිර්වචන

ජාතිය / ජනවාර්ගිකත්වය / ස්ත්‍රී පුරුෂ භාවය / ලිංගික නැඹුරුතාවය / ආගම / වයස / ශාරීරික හෝ මානසික ආබාධ සහ වෙනත් උප ලක්ෂණ මගින් හඳුනාගෙන ඇති සමාජ කණ්ඩායමක සාමාජිකත්ව (සාමාජිකත්වය දරන බවට චෝදනා කරමින්) පදනම මත පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායම් දකින වෛරය මුසු වූ ප්‍රකාශනයන් හෝ කථනයන්ය.

**BRITANNICA ශබ්දකෝෂය**



# ඒක්සත් ජාතින්ගේ ප්‍රකාශනයට අනුව වෛරී ප්‍රකාශන අර්ථ ගැන්වෙන්නේ,

කථාව, ලිවීම හෝ හැසිරීම් වල යම් ආකාරයක සන්නිවේදනයක්, පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් ගැන සඳහන් කරමින් වෙනත් කෙනෙකුගේ ආගම, ජනවාර්ගිකත්වය, ජාතිකත්වය, ජාතිය මත පදනම්ව අහිතකර හෝ වෙනස් කොට සලකන භාෂාවකට පහර දීම හෝ භාවිතා කිරීම, සම්භවය, ස්ත්‍රී පුරුෂ භාවය හෝ වෙනත් අනන්‍යතා සාධකය යනුවෙනි.
**(එක්සත් ජාතීන් 2019:2)**




ඒමෙන්ම, පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් යම්කිසි සමූහයකට අයත් නිසා හෝ යම්කිසි ආකාරයක අනන්‍යතාවන් බෙදාගන්නා නිසා හෝ අපවාදයකට ලක් කළ / ලක් විය හැකිය. එය වෛරී කථනයක් ලෙස හඳුනාගැනේ. මක් නිසාද වෛරී ප්‍රකාශන ඉලක්ක ගත කණ්ඩායමක් කෙරෙහි නිරන්තර විරෝධය, ද්වේෂය හා වෛරය තිව්‍ර කිරීමට දායක වන බැවිනි.
ඒසේම, අප මෙහිදී වටහා ගත යුත්තේ වෛර කිරීම හා සසැඳෙන සියලු වචන අඩංගු වූ බැවින් පමණක් ඒය වෛරී ප්‍රකාශනයක් නොවන බවයි.




## 1.2 වෛරී කථාවේ බලපෑම මගින්,

### 1.2.1 නිදහස් සමාජයේ අඩිතාලම වලට හානි පමුණුවයි

ආගමික සිද්ධස්ථාන විනාශ කිරීමට පෙළඹවීම, ජීවනෝපාය විනාශ කිරීමට පෙළඹවීම, ව්‍යාපාර ගණුදෙනු අඩාල කරවීමට පෙළඹවීම වැනි අහිතකර දේවල් වෛරී ප්‍රකාශන නිසා නිරන්තරව ඇතිවිය හැකියි.
ඒය ස්ථාවර පැවැත්මට හානිකර තත්වයක් ඇති කරයි.

### 1.2.2 මිනිසාගේ ගෞරවයට හානි පමුණුවයි

ප්‍රකාශන මාධ්‍ය (සමාජ මාධ්‍ය ජාලා / මුද්‍රිත මාධ්‍ය) හරහා වෛරී ප්‍රකාශන නිකුත් කිරීම තුළ මානව ගෞරවය බිඳ වැටීමේ සම්භාවිතාව ඉහලය.
එමගින් පුද්ගල සහ පුද්ගල කණ්ඩායම් අතර නොසන්සුන් තත්වයන් නිර්මාණය කරයි



## 1.2.4 සමාජ ස්ථාවරය සඳහා ඍණාත්මක ලෙස බලපායි

වෛරී කථනය, පුද්ගල සහ පුද්ගල කණ්ඩායම් අතර මානසික අවපීඩන තත්වයන් ඇති කරන අතර ඒකිනෙකා කෙරෙහි ගරුත්වය, විශ්වාසය, ආදරය වැනි සංවේදී සංකල්ප වලට අහිතකර බලපෑම් එල්ල කරයි.
මෙසේ බිඳවැටෙන පුද්ගල අන්තර් සම්බන්ධතා සෘජුවම සමාජයක ස්ථාවර පැවැත්මට බාධාවන් එල්ල කරයි.

## 1.2.5 ඉලක්කගත පුද්ගලයාට සහ කණ්ඩායම් වලට මානසික හානියක් ඇති කිරීම

ජනවර්ගයන් වශයෙන්, ආගමික වශයෙන්, කුලය, පන්තිය, ස්ත්‍රී පුරුෂ බව ආදි කවර හෝ සාධකයන් මත කවරෙකු හෝ පහත් කොට සැලකීමට පෙළඹවීම අතිවිශාල සමාජ බේදවාචකයක් ආරම්භයක් විය හැකිය. මෙබඳු අමිහිරි අත්දැකීම් අහිතකර ප්‍රතිඵල වලට ශ්‍රී ලංකාව දශක ගණනාවක් පුරා මුහුණ දී ඇත.

## 1.2.6 ප්‍රචණ්ඩත්වය හා ගැටුම් දක්වා වර්ධනය වීමේ හැකියාව

- පහර දෙන ලෙස පෙළඹවීම. (ශාරීරික වදහිංසා)
- දේපල විනාශ කිරීමට පෙළඹවීම

## 1.2.7 වෛරී ප්‍රකාශන වලට අපරාධයක් දක්වා විකාශනය වීමේ හැකියාව පවතියි

මෙයට ආසන්නතම උදාහරණය රුවන්ඩාවේ ටුට්සි සහ හුටු ගෝත්‍රිකයන් අතර සිදු වූ සමූල ඝාතනයයි. මෙහිදී ජන මාධ්‍ය ඔස්සේ ඒක් ගෝත්‍රයක් අනෙක් ගෝත්‍රයට විරුද්ධව අඛණ්ඩව වෛරී ප්‍රකාශනයන් දියත් කරන ලදී. ඒහි අවසාන ප්‍රතිඵලය වූයේ උක්ත ගෝත්‍ර දෙක අතර සිදුවූ ගැටුම් / අපරාධ හේතුවෙන් එය සමූල ඝාතනයක් දක්වා වර්ධනය වීමයි.

( ඔබට මේ පිළිබඳව වැඩි විස්තර Hotel Rwanda චිත්‍රපටය නැරඹීමෙන්ද ලබා ගත හැකිය)

## 1.3 වෛරී කථනයේ සන්නිවේදකයන් කවුද?

වෛරී කථනයකදී පුද්ගලයන් බොහෝ විට උත්සාහ කරන්නේ තමන් වෛරී කථනයේ නොයෙදෙන්නන් ලෙස හඳුනා ගැනීමටයි. ඒමෙන්ම ඔවුන් බෝහෝ විට අනෙක් පුද්ගලයන් හෝ සමාජ කණ්ඩායම් වෛරී ප්‍රකාශන වල නිරත වන බවට චෝදනා කරති. නමුත් මෙහිදී අවධාරණය කර ගත යුත්තේ තමන් තුළිනුත් වෛරී ප්‍රකාශ නිකුත් වීමේ හැකියාව පවතින බවයි.
ඒය දැනුවත්ව හෝ නොදැනුවත්ව සිදුවිය හැකිය. එනම් තමන් කරන ප්‍රකාශය වෛරී සහගතද නැද්ද යන්න අවබෝධයකින් තොරව ප්‍රකාශනය නිකුත් කිරීමයි.



ඔබ මේ වන විට වෛරී ප්‍රකාශනයන් යනු කුමක්ද?
ඒ පිළිබඳව ජාත්‍යන්තර නිර්වචනයන් මොනවාද
සහ වෛරී කථාව විසින් පුද්ගල
කණ්ඩායම් වලට සහ සමාජයට සිදු කරන
අහිතකර බලපෑම් කුමක්ද
යන්න පිළිබඳව මනාව
අවබෝධයක් ලබා ගෙන ඇත.

# 2. වෛරී ප්‍රකාශන ඇති වන්නේ ඇයි ?

## 2.1 වෙනස් කොට සැලකීම

පුද්ගල අනන්‍යතාවයන් වල ඇති විවිධත්වයන් නිසා ඇතිවිය හැකි ප්‍රචණ්ඩත්වයේ ගාමක බලවේගය ලෙස වෛරී ප්‍රකාශනයන් ක්‍රියාත්මක වේ. සමාජ මාධ්‍ය තුල ව්‍යාප්ත වන වෛරි අන්තර්ගතයන් අධික්ෂණය කිරීමේදී, ශ්‍රී ලංකාවේ වෛරී ප්‍රකාශනයන් ඉහල යාමේ ප්‍රවනතාවයන් පෙන්නුම් කරයි. දශක තුනක යුද ගැටුමෙන් පසුවුවද සමාජ සංහිදියාවට හිතකර මහජන මතයන්හි වර්ධනය අඩාලවීම සහ ප්‍රචණ්ඩ ක්‍රියා නැවත නැවතත් ඇතිවීම කෙරෙහි වෙනස්කොට සැලකිම තුල ඇතිවන ආතතිය දායක වී ඇත.

## 2.2 ප්‍රචණ්ඩකාරී ක්‍රියාකාරිත්වය සාධාරණකරණිය කිරීමට අවශ්‍ය පසුබිම ගොඩනගා ගැනීම

මේ සඳහා ශ්‍රී ලාංකික සමාජය තුළ සිදු වු අම්හිරි මතකයන් කිහිපයක් තුළින් උදාහරණ සැපයිය හැකිය.

කට වචනයෙන් පැතිර යන කටකථාව 1958, 1983 දි දෙමළ සුළුතරය ඉලක්ක කර ගත් ජනවාර්ගික ප්‍රචණ්ඩත්වයේ වැදගත් ධාවකයෙකු වු අතර 1915 දි ද මුස්ලිම් විරෝධි ප්‍රචණ්ඩත්වයේ රැල්ල හමා යන්නට විය. එමෙන්ම මෑත දශකයන් වලදී සුළුජාතීන් ඉලක්ක කර ගත් ජනවාර්ගික සතුරුකම් (සිල්වා 2016, සිල්වා මහිස්, හපුආරච්චි සහ නුහුමාන් 2020, 1996) වර්ධනය වු අතර ඒවාට ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීමේ හැකියාව නිසා (සමාජ මාධ්‍යය මඟින්) මෙවැනි කටකතා වලට තටු ලැබෙන්නටද විය.




2012 සිටද විවිධ ප්‍රචණ්ඩකාරී ක්‍රියා විවිධ අවස්ථාවල වාර්තා වු අතර ආගමික ස්ථාන, දේපළ හා මනුෂ්‍ය ජිවිත වලින්ද ඒවාට වන්දි ගෙවිමට සිදුවිය. විශේෂයෙන්ම මුස්ලිම් ජනතාව ඉලක්ක කරගෙන දිගන ප්‍රදේශයේ සිදු වු ගැටුම, අලුත්ගම දර්ගා නගරයේ සිදු වු ගැටුම් මෑත කාලින උදාහරණ ලෙස පෙන්වා දිය හැකි අතර මෙහිදී සෑම විටම ප්‍රචණ්ඩකාරී ක්‍රියා සිදුවිම හා සාධාරණීකරණය කිරීමට අවශ්‍යතාව මතුවී තිබුණු බව විද්‍යාමාන වේ. මෙවැනි බේදවාචකයන් වල පසුබිම් මුලාශ්‍රය වුයේ වෛරී ප්‍රකාශනයන් බව ඒ පිළිබඳ පරෙස්සමෙන් අධ්‍යයනය කරන කවරෙකුට වුවද පෙනි යයි.

පාස්කු ප්‍රහාරයෙන් පසු ශ්‍රී ලංකාවේ ඊශාන දිග සහ බස්නාහිර පළාත් වල තෝරා ගත් ස්ථාන කිහිපයක මුස්ලිම් විරෝධි ප්‍රචණ්ඩත්වය පිළිබඳව සිදු කල අධ්‍යයන්වල (සිල්වා 2016, සිල්වා මහිස්, හපුආරච්චි සහ නුහුමාන් 2020) දෘෂ්‍යමාන වු දෙයක් වී ඇත්තේ බොහෝ සිංහල ප්‍රතිධාරකයන් විසින් මුස්ලිම් ජනතාව ජන විකාශනයට ක්‍රියා කරන බවට කරුණු දැක්වීමය. එම නිසා මෙම ප්‍රහාරයන් සක්‍රිය කිරීම නොඑසේ නම් සාධාරණීක-රණය කිරීමට ඔවුන් පෙළඹී ඇත.

## 2.3 යම් ජන කොට්ඨාශයකට එරෙහිව වැරදි මතයක් සමාජගත කිරීම

මෙයට ආසන්නම උදාහරණය වන්නේ 2019 දී, ව්‍යාප්ත වු කොවිඩ් 19 වෛරසයයි. ශ්‍රී ලංකාවේ කොවිඩ් වෛරසයේ අසාධිත ප්‍රභවය මුස්ලිම් ජනතාව බව ඉලක්ක කර ගනිමින් වෛරී ප්‍රකාශන බෝහෝ සෙයින් ජනගත වු අතර මුහුණු පොතෙහි පළවු බොහෝ සාකච්ඡා මගින් ඒහි වගකීම මුළුමනින්ම මුස්ලිම් ජාතිකයන්ට පෞද්ගලිකව හා සාමුහිකව පැවරෙන්නට විය.






# 3. වෛරී ප්‍රකාශන හඳුනාගැනීම

වෛරී ප්‍රකාශ හඳුනාගැනීමේදී, එම ප්‍රකාශනය බෙදාහරින්නන් අභිප්‍රාය පිළිබඳව සලකා බැලිය යුතුය.

නිදසුනක් වශයෙන් අපහාසාත්මක පදවල තේරුම පැහැදිලි කිරීමට උත්සාහ කරන අවස්ථාවක හෝ ඒහි වෛරී පදනමක් නොමැති සන්දර්භයක් තුළ වාර්ගික යෙදුම් භාවිතා වීම, වෛරී කථන ලෙස සැලකෙන්නෙ නැත.

ඒසේම, යම් ප්‍රකාශනයක අපහාස අන්තර්ගතය තිබීමෙන් පමණක් එය වෛරී ප්‍රකාශයක් ලෙස හඳුනාගන්නේ නැත.

- සාමාන්‍යයෙන් අපහාස කිරීමේදී පුද්ගලයෙකු ඉලක්ක කර ගැනීම අනිවාර්ය සංසිද්ධියක් නොවේ, එය ශෛලිය අරමුණු සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් හෝ යමක් අවධාරණය කිරීම සඳහා වුවද භාවිත කර හැකිය.

- වෛරී ප්‍රකාශනයන් සඳහා කිසිදු අපහාසාත්මක වචනයන් එක් නොකොට වුවද පුද්ගලයකුට හෝ පුද්ගලයන් සමුහකයට අපහාස කිරීම කිරීමේ හැකියාව ඒ තුළ පවතියි.



## 3.1 සමාජ මාධ්‍ය තුළ වෛරී ප්‍රකාශ හඳුනා ගැනීම.

සමාජ මාධ්‍ය තුළ ඔබ දකින ප්‍රකාශන වල ආගම, සමේ වර්ණය, ලිංගික අනන්‍යතාවය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ජන වාර්ගිකත්වය, හෝ ජාතික සම්භවය පදනම් කරගෙන කිසියම් කණ්ඩායමකට හෝ පුද්ගලයන්ට එරෙහිව අපහාස කිරීම, නින්දා කිරීම හෝ වෛරය ඇති කිරීමේ අරමුණින් අදහස් බෙදා ගන්නේ නම් එබඳු පළ කිරීම්, බෙදා ගැනීම් **අන්තර්ජාලය හරහා සිදු කරන වෛරී** ප්‍රකාශ ගනයට වැටේ.



# 4. වෛරී ප්‍රකාශ කළ හැකි මාධ්‍යයන්

- සමාජ මාධ්‍ය (රූප, වචන, සංකේත)
- පොදු මහජන රැස්වීම
- මාධ්‍ය හමු
- කුඩා කණ්ඩායම් සාකච්ඡා
- රූපවාහිනි
- රේඩියෝ
- පෝස්ටර්
- කැලෑ පත්තර
- කට කථා

# 5. සමාජ මාධ්‍යය හා වෛරී ප්‍රකාශන

ආධුනිකයන්ට හා වෘත්තිකයන්ට අදහස් රූප, වීඩියෝ, චිත්‍ර, සංගීත හා තවත් බොහෝ දේ නිර්මාණය හා බෙදා හදා ගැනීමට සමාජ මාධ්‍ය කදිම ස්ථානයකි. එමෙන්ම එහි ඇති ප්‍රජාතන්ත්‍රවාදි හා නිර්මාණාත්මක ස්වාභාවය නිසාම ජංගම දුරකථන සහ අන්තරජාලය වෙත ප්‍රවේශවීම වැඩි වී ඇති අතර ඒ තුළ පුද්ගල අනන්‍යතාවයන් මත සිදුවන ගැටුම්, අමනාපය, වෛරය, සමාජ ප්‍රචණ්ඩත්වය හා අන්තර් සමාජ අසමගිය වර්ධනය වී ඇති බව හෙළි වී ඇත, (ලොහානි, 2021) වර්තමානය වන විට ගෝලීය ජනගහනයෙන් 1/3කට ආසන්න ප්‍රමාණයක් මුහුණු පොත භාවිත කරන අතර එය ප්‍රධාන සන්නිවේදන නාලිකාවක් බවට නිතරඟයෙන්ම පත්ව ඇත. (2019, ලිව්) එමෙන්ම වෛරී පණිවිඩ ප්‍රචාරණය කිරීමට, ප්‍රචණ්ඩ ව්‍යාපාර සඳහා බඳවා ගන්නන් සොයා ගැනිමට සහ ව්‍යාජ නම් භාවිත කරමින් තම අනන්‍යතාවය සැඟවීමට ඇති හැකියාව, වැරදි තොරතුරු පදනම් කරගෙන පුද්ගලයින් ප්‍රකෝප කිරීමට ඇති හැකියාව සහ ප්‍රචණ්ඩත්වය සාධාරණීකරණය කිරීමට ඇති හැකියාව සමාජ මාධ්‍යයේ අනිසි භාවිතාවකි.

එහි තවත් පැති කඩක් ලෙස පටිගත කර පෙරලා ඒවා උඩුගත කිරීමේ ප්‍රවනතාවන් දැකිය හැකිය.

උදාහරණයක් ලෙස,
2018 දී පීටස්බර්ග් / සිනගෝනයට පහර දුන් ප්‍රහාරකයා, වෛරී ප්‍රකාශ මුසු වූ අන්තවාදී මත ප්‍රචාර්ණය වෙනුවෙන් නබ් නම් සමාජ මාධ්‍යයක් කාලයක් තිස්සේ භාවිතා කර තිබුනි. එහිදී, යුදෙව්වන් විසින් එක්සත් ජනපදයට සංක්‍රමණිකයන් ගෙන ඒමට සහ තම රටේ සුදු ජාතිකයන් සුළුතරයක් කිරීමට නිරන්තර උත්සාහයක යෙදෙන බවට ඔහු විසින් මතවාද පළ කරන ලදී. එයට වන්දි ගෙවීමට සිදුවුයේ සරණාගතයන් සඳහා ආගමික සේවාවකදී බැතිමතුන් 11 දෙදෙනෙකුගේ ජීවිත අහිමිවීම තුළිනි.

# තවත් උදාහරණයන්....


- ප්‍රංශයේ ද සුදු නොවන සංක්‍රමණ සහ උපත් අනුපාතය පිළිබඳ ජන විකාශන මානයන් වර්ධනය වෙමින් පවතින ආකාරය දැකිය හැකිය. ලොව පුරා බොහෝ රටවල සංක්‍රමණිකයන් හා සුළු ජාතින් ඉලක්ක කර ගනිමින් ඔවුන් පැවැත්මේ තර්ජනයක් සහ විශ්ව සතුරෙකු ලෙස හඳුනා ගැනීමේ ප්‍රවණතාවයක් වර්ධනය වෙමින් පවතියි.

- 2019 දී නවසිලන්ත මුස්ලිම් පල්ලියකදි වෙඩි තැබිම සිදු කළ සමූහ ඝාතකයා අධිකරණය ඉදිරියේදී ප්‍රකාශ කලේ, මුස්ලිම් ජාතිකයන් ජන විකාශනය සහ ආගමික ව්‍යාප්තිය තුළින් තම වර්ගයාට තර්ජනයක් වන බවයි. එමෙන්ම කිතුදහමේ විශ්වාසවන්ත අනුගාමිකයෙකු ලෙස සිදු කල සදාචාරාත්මක යුතුකමක් බවත් ඔහුගේ අදහසයි.

- කෙසේ වෙතත් මෙම තත්ත්වය අධිරාජ්‍යවාදී රටවල් වලට පමණත් සීමා වුවක් නොවේ.

ඉන්දියාවේ මුස්ලිම් හා ක්‍රිස්තියානි ප්‍රජාවන් ඉලක්ක කරගත් අන්තවාදි හින්දු ජාතිවාදින්, බංග්ලාදේශයේ බෞද්ධ හා හින්දු ප්‍රජාවන් ඉලක්ක කරගත් ඉස්ලාමිය අන්තවාදය හා සමානව ජන විකාශනය පිළිබඳ භීති මනෝභාවයකින් යුක්තව කරමින් සිටියි. (බොහෝ විට එකිනෙකාගේ අන්‍යතාවයන් විවේචනය කරමින් WhataApp හෝ Facebook ආදි මාධ්‍ය වල කටකථා වලින් පටන්ගත් ඇතැම් වෛරී ප්‍රකාශන අවසානයේදී වර්ගවාදි ප්‍රචණ්ඩ ක්‍රියා බවට පරිවර්තනය වී /වෙමින් පවතියි)




PAD
MAN


රටේ අගමැති කමට හොඳම කව්ද....?
Like
comment
බලු උනු
අගමැති
ශෝචනීයයි


23000
පොලිසියට ස්තුතියි


joke.lk
සමනලයා මල හා ලමයා සේ
බාල ලමා වයසේ...
පෙර තිදෙනා...
සිටියේ එක යායේ
ජීවිතයේ අරුමේ...


අනතුර අත ලග
තව දුරටත් ඇස් පියාගෙන සිටිනවාද..?
වයස අවුරුදු 9න් පහල ලමුන්
Northern
North Central
North Western
Central
Southern
සිංහල
දෙමළ
වෙනත්
48%
52%
මුස්ලිම්
පුංචි පවුල රත්තරං.,
කාපු ලනුව ඉස්තරම්
තව වසර 15කට පසු රට කාගෙද.?
DLwickzz@Gmail.com



දැක්ක ගමන් හිතුවේ
මේ අරාබිය කියලා නේද..?
නෑ
ඔබට හිතුණා වැරදි. මේ අරාබියක්
වෙන්න යන රටේ එක ප්‍රදේශයක්



දැන් අපි
අහන්න
ඕනී..........


DLwickz
ප්‍රමාණයකට උඩදාපන්..
මේ නංගිත් කියවන්නේ
SAHAරාන් අයියා කියවපු
පොතම තමයි..


الله اكبر


Meera Muba Mohamed
මුස්ලිම් කොරෝනා රෝගීන්
ගාන කියනවා වගේම
බෞද්ධ රෝගීන් ගාන
කතෝලික රෝගීන් ගාන
හින්දු රෝගීන් ගාන
කිව්වොත් හොඳයි නේද?
ලෝකෙටම කෙලවෙලා ඉන්න වෙලාවෙ
පෝස්ට් එක
කමෙන්ට් එක
Chanaka Rajapaksha
වෙනම කාදි උසාවි ඕනි ඔබට, වෙනම විවාහ නීති ඕනි ඔබට,, වෙනම අහාර ඕනි ඔබට , වෙනම ඇඳුම් ඕනි ඔබට,, රටේ සමස්ත නීතිය පිටින් මේවා සපුර ගන්න ඔබලාට මුස්ලිම්වරු කියන්නේ නැතිව කියන්න ඕනි නම කියපල්ලා බලාන්න,,
6 hrs Love Reply 37


කොටියා
මරපු සිංහයා
ඉන්න
රටේ
ඔලුවා මොන
ගේමක්ද


ඉන්දියාවෙන්
කොරෝනා
ගෙනා
15 ලංකාවට
ඇවිත්
අකුරණ
නානා
මහනුවර කටුගස්තොට ගලගෙදර
පරගහදෙනිය මාවතගම කුරුණෑගල
සපත්තු කඩවල රවුම් ගහලා


1


HOMOSEXUALITY IS A MENTAL ILLNESS!!!
THE WORLD HEALTH ORGANIZATION, WHO DECLARED THAT HOMOSEXUALITY IS NOT A MENTAL ILLNESS MORE THAN 30 YEARS AGO:


හැදුවෙ
චීනා
Made in China
Brand name Corona
නම
කොරෝනා
පතුරන්නෙ
නානා
Wholesale distribution in SL by Nana


2019
2020


Back to Mahinda
සිංහල කොටිය
බුද්ධි අංශවලට අනුව
එක්නැලිගොඩ කියන්නෙ
මාධ්‍යය වේදියෙක් ලෙස පෙනීසිටිමින්
වැටුපට ත්‍රස්තවාදීනට සේවයකල
සිංහල කොටියෙකි.